# පුනරුත්පත්තිය

## (වෛද්‍ය ඉයන් ස්ටීවන්සන්ගේ "Reincarnation" නම් ලිපිය ඇසුරෙනි)

**ජේ. තේජනී කසුන්කා ජයවර්ධන**



1918 සිට 2007 දක්වා කාලය තුළ මනෝවෛද්‍යවරයෙකු වූ ඉයන් ස්ටීවන්සන් අවුරුදු පනහක කාලයක් වර්ජිනා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සේවය කර ඇත. ඔහු 1957 සිට මනෝවෛද්‍ය අධ්‍යයන අංශයේ ප්‍රධානත්වය ඉසුලූ අතර, 1967 සිට 2001 කාලය තුළ මනෝවෛද්‍ය අංශයේ මහාචාර්ය ධූරය හොබවන ලදී. වර්ජිනා විශ්වවිද්‍යාලයේ පාරමනෝවිද්‍යාත්මක සංසිද්ධීන් වන පුනරුත්පත්තිය (Reincarnation), මරණ මංචකය ආසන්න අත්දැකීම් (Near – Death of body experience), මරණයෙන් පසු සන්නිවේදනය (After-Death Communications), මෙන් ම මරණමංචකය (Deathbed visions) පිළිබඳ අධ්‍යයනය කිරීමේ පුරෝගාමියා මෙන් ම අධ්‍යක්ෂ ධූරය වෛද්‍ය ඉයන් ස්ටීවන්සන් විසින් හොබවන ලදී. පුනරුත්පත්තිය පිළිබඳ ඔහුගේ පර්යේෂණ ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට භාජනය විය. පසුගිය අවුරුදු හතලිහ පුරාවට පසුගිය මතකයන් සහ කායික වශයෙන් තිබෙන කැළැල්, තුවාල යනාදිය පසුගිය ජීවිතයෙන් තවත් ජීවිතයකට ගමන් කිරීම සවිස්තරාත්මකව අධ්‍යයනය කිරීම තුළින් ඔහු මේ පිළිබඳ අදහස් දක්වා ඇත. වෛද්‍ය ඉයන් ස්ටීවන්සන් විසින් තම පෙර උත්පත්තිය සිහි කළ හැකි දරුවන් තුන් දහසකගේ සිදුවීම් අධ්‍යයනය කිරීම මේ සඳහා උදාහරණ ලෙස දැක්විය හැක. ඉතාමත් නිවරදි වූ සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් ඔහු ඉදිරිපත් කරන පරිදි අයෝග්‍ය හැකියා, විවිධ අසනීපයන්, භීතිකාවන් යනාදිය ආරමය පදනමක් මත ම පැහැදිලි කළ නොහැකි බවයි. පාරභෞතික මනෝවිද්‍යාවට ඉමහත් සේවයක් කළ වෛද්‍ය ඉයන් ස්ටීවන්සන් 2007 වර්ෂයේදී මෙලොවින් සමුගෙන ඇත.

**<u>හැඳින්වීම</u>**

පුනරුත්පත්තිය යන පදය අර්ථකථනය කිරීමේ දී එමගින් අදහස් වන්නේ යම් පුද්ගලයෙකුට භෞතික ශරීරයක් හෝ අභෞතික ශරීරයක් හෝ චෛතසික සංරචයක් ඇති බවයි. චෛතසික සංරචකය මගින් භෞතික ශරීරයේ මරණය ප්‍රවර්තනය කිරීම හේතුවෙන් ඊට ඔරොත්තු දීම සිදුකර පසුව නවතම භෞතික ශරීරයක් සමග සංඝටනය සිදු කරනු ලබයි.

**<u>විශ්වාසය</u>**

මෙම විශ්වාසය ක්‍රිස්තියානීන් හා ඉස්ලාම් භක්තිකයින් විසින් හැරෙන්නට අනෙකුත් සියලුම ප්‍රධාන ආගම් අදහන්නන් විසින් (විස්තරාත්මකව විවිධත්වයක් ඇතිව) අනුගමනය කරනු ලැබේ. ඊට අමතරව ශියා මුස්ලිම් කණ්ඩායම් සමාජිකයින් ද පුනරුත්පත්තිය පිළිබඳ විශ්වාස කරති. එමෙන්ම බටහිර රටවල නාමික ක්‍රිස්තියානි වශයෙන් හඳුන්වනු ලබන්නන් ගේ සියයට 20 හා 30 අතර ප්‍රමාණයක් ද පුනරුත්පත්තිය පිළිබඳ විශ්වාස කරති. පුනරුත්පත්තිය සාධාර්මික යුදෙව් ආගමේ අංශයක් නොවුව ද, Hasidism යනුවෙන් හඳුන්වනු ලබන මූලධර්මවාදී යුදෙව් ආගමික නිකායේ එක්තරා කණ්ඩායමක් පුනරුත්පත්තිය විශ්වාස කරති. මානව විද්‍යාඥයින් විසින් අප්‍රිකාවේ, උතුරු සහ දකුණු ඇමරිකාවේ, ඕස්ට්‍රේලියාවේ සහ ශාන්තිකර සාගරය අවට කලාපයේ රටවල් ද සියලුම සම්ප්‍රදායික ආගම් හා ජනවාර්ගික කොට්ඨාශයන් හි ජනතාවගේ විශ්වාසයන් පිළිබඳ සාක්ෂි ගත ලේඛන වාර්ථාගත කර ඇත. ක්‍රිස්තියානි මිශනාරිවරුන්ගෙන් හා දේවසභාවෙන් පැන නගින නිශේධාත්මක අකල්ප පැවතිය ද උතුරු අමරිකාවේ වයඹදිග ප්‍රදේශයේ ගෝත්‍රිකයින් විසින් පුනරුත්පත්තිය පිළිබඳ විශ්වාසය අඛණ්ඩව පවත්වාගෙන ගියහ. 16 වැනි සියවසේ විසූ ජර්මානු දාර්ශනිකයෙකු වූ ආතර් ෂොපෙන්හවර් (Arthur Shopenhauer) විසින් අර්ථ ප්‍රකාශය කරන ලද්දේ ලෝකයේ රටවල් අතරින් යුරෝපයේ ජනතාව පුනර්භවය පිළිබඳව විශ්වාස නොකරන බව ය.

**සාක්ෂි**

පුළුල් විවිධත්වයකින් යුත් සංසිද්ධීන් ගණනාවක් පුනරුත්පත්තිය පිළිබඳ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලබයි.

**<u>මෝහනය මගින් පෙර ආත්මය කරා ගෙනයාම</u>**

බොහෝ සංවේදී පුද්ගලයින් තම සේවාලාභීන්ගේ පෙර ආත්මය පිළිබඳ ප්‍රකාශ කිරීම සඳහා උද්යෝගිමත් වෙති. නමුත් එම ප්‍රකාශන බොහෝ විට අවිනිශ්චිත, ප්‍රයෝජනයක් නොමැති මෙන්ම සත්‍යාපනය කළ නොහැකි තොරතුරු ය. ඔවුන් මෝහනය කිරීමෙන් පසු තම පෙර භවය පිළිබඳ ආසන්න වශයෙන් එකම දේ ප්‍රකාශ කරති.

බෙහෝ තොරතුරු ඓතිහාසික ප්‍රබන්ධ වශයෙන් සැලකිය හැකිය. එමෙන්ම එම තොරතුරු බොහෝමයක් සත්‍යාපනය කළ නොහැකි මෙන්ම ඒවා ගුවන් විදුලියෙන්, රූපවාහිනියෙන් මෙන්ම කියවීමෙන් හා වෙනත් මූලාශ්‍රයන්ගේ අභාෂයන්ගෙන් ලබන උත්තේජනයන් අනුව සිදුවන්නකි. (Stevenson 1994) මෝහනය මගින් පුනර්භවය සිහිකළ හැකි බව දක්වන ප්‍රකාශන අවාසනාවකට මෙන් ලොව මුළුල්ලේම ප්‍රසිද්ධ වී ඇති බව ත්, එය හෙළා දැකිය යුතු බව ත් බොහෝ දෙනාගේ මතයයි. බොහෝ විට මෝහන විද්‍යාඥයන් වශයෙන් හඳුන්වා ගන්නා නූගත් මෝහනකරුවන් විසින් නූගත් ජනයා ගොදුරුකර ගනිති. කෙසේ වෙතත් මෝහනය මගින් පෙර ආත්මය කරා ගෙනයාමේ

ක්‍රියාවලිය පිළිබඳ විධිමත් පර්යේෂණ පැවැත්වීම සඳහා උද්යෝගිමත් කළ යුතු ය. මෝහනය කිරීම මගින් කළාතුරකින් අනාවරණය වන අසාමාන්‍ය සිද්ධියක් වන්නේ කෙනෙකු මෝහන ආවේශයෙන් සිටින විට තමා කිසිදු නූගත් භාෂාවක් චතුර ලෙස භාවිතා කිරීම ය (Stevenson 1994).

## කුඩා දරුවන් පිළිබඳ අත්දැකීම්

පුනරුත්පත්තිය පිළිබඳ විශ්වාසය තහවුරු කරන ප්‍රබලතම සාක්ෂිය වන්නේ විශේෂයෙන් වයස 2-5 අතර කුඩා දරුවන් විසින් තමා මෙලොවට බිහිවීමට පෙර ඉකුත් භවය පිළිබඳ විවිධාකාර ප්‍රකාශ සිදුකිරීමයි. බොහෝ විට දෙමව්පියන් මෙවැනි සිද්ධීන් වසන් කිරීමට ප්‍රයත්න දරන්නේ එමගින් තම පවුල කෙරෙහි අනාගතයේ ඇතිවිය හැකි ගැටළුකාරී තත්ත්වයන් මගහරවා ගැනීමේ අභිලාෂයෙනි. උදාහරණයක් වශයෙන් දැක්විය හැකි එක් සිද්ධියක් වන්නේ කුඩා දරුවෙකු තමාගේ පෙර භවයේ සිද්ධියක් පැහැදිලිව ප්‍රකාශ කිරීමයි. එනම් ගංවතුර සමයකදී ජලයෙන් පිරී මහාමාර්ගයක සිටියදී තමා පසුකර ගිය බස් රථයකින් ඇඟට වැදුනු දිය පහරට ගොදුරුව කුඹුරට විසිවී යාමෙන් දියේ ගිලී මියගිය බව ප්‍රකාශ කිරීමයි. මෙම කුඩා ගැහැණු දරුවාගේ ප්‍රකාශය සත්‍ය බව සනාථ වූයේ එම ගම්මානය අසල ගමක දරුවෙකු ගංවතුර සමයකදී බසයට ඉඩ දීමට පාරෙන් අයින් වූ විට කුඹුරේ ජලාශයට වැටී මියගොස් තිබීම හේතුවෙනි. ඊට පෙර වුව ද, මෙම දරුවා මුල සිට ම දියේ ගිලී නෑමට ත්, බස් රථ වලටත් ඉමහත් බියක් දක්වා තිබුනි. තවද මෙම පවුලේ සාමාජිකයින් පාන් හා පැනි රස භාවිතයෙන් තොර වුව ද, මෙම දරුවාගේ ප්‍රියජනක ආහාර වන්නේ එම වර්ගයන් ය. පසුව සොයාබැලීමේ දී අනාවරණය වූයේ පෙර භවයේ මියගිය දරුවාගේ ප්‍රියතම ආහාරය වූයේ ද එම වර්ගයන් බව ය (Stevenson 1977).

ලෝකයේ බොහෝ රටවල මෙවැනි සිද්ධීන් 2500 ක් පමණ විමර්ශණයට භාජනය කරන ලද බව වාර්තා වී ඇත. ඉන් ඇතැම් රටවල් වන්නේ දකුණු හා බටහිර ආසියාව, බටහිර අප්‍රිකාව හා උතුරු ඇමරිකාවේ වයඹ දිග ප්‍රදේශ ආදියයි. මෙම බොහෝ ප්‍රදේශයන් හි වාසය කරන්නනන් වන්නේ පුනර්භවය පිළිබඳ විශ්වාස කරන විවිධ ගෝත්‍රික ජනතාව ය. කෙසේ වෙතත් එවැනිම සිද්ධීන් 200 ක් පමණ බටහිර රටවල, එනම් බටහිර යුරෝපයේ ගෝත්‍රික ජනයා අතර සහ ගෝත්‍රික නොවන ජනයා අතර ගෝත්‍රික නොවන ජනයා ජීවත්වන එක්සත් ජනපදයේ සහ කැනඩාවේද සිද්ධීන් විමර්ෂණයට භාජනය කර ඇත. සියලුම සංස්කෘතීන්ට අනුකූලවන විධිමත් භාවයන්ගෙන් යුක්ත මෙවැනි උප ලක්ෂණ (4) හතරක් හඳුනාගෙන ඇත. පුනර්භවය පිළිබඳ කුඩා අවධියේ සිටම ප්‍රකාශ කිරීම. එවැනි ලක්ෂණන් හඳුන්වන්නේ සාර්වත්‍රික උප ලක්ෂණ වශයෙනි. 2-5 දක්වා, වයස 5-8 අතර කාලයේ දී පෙර භවයේ සිද්ධී වරින් වර අමතක වීම හා නැවත සිහිපත් වීම බොහෝ විට ප්‍රචණ්ඩකාරී මාරක සිද්ධීන් පිළිබඳව අමකත වීමට අවකාශය ඇත. අනිකුත් උප ලක්ෂණයන් විවධ සංස්කෘතීන්ගේ පැවැත්ම අනුව වෙනස් වීමට ඉඩ ඇත. උදාහරණයක් ලෙස දැක්විය හැකි කරුණක් වන්නේ මියන්මාරයේ (කලින් බුරුමයේ) සියයට 26 ක ප්‍රමාණයක් දරුවන් පවසන අන්දමට ඔවුන් පෙර භවයේ දී ප්‍රතිවිරුද්ධ ලිංගික භාවයෙන් ජීවත් වී ඇත. (Stevenson 1983). මෙම ලිංගික වෙනස නයිජීරියාවේ බහුල වශයෙන් සිදුව ඇති නමුත් එවැනි සිද්ධීන් ලේබනනයේ හෝ උතුරු ඇමරිකාවේ වයඹ ප්‍රදේශයේ ගෝත්‍රිකයින්ගේ පුනර්භාවී දරුවන් අතර කිසිසේත් දක්නට නොලැබේ. ලිංගික

වෙනස් වීම පිළිබඳ විශ්වාස නොකරන ජන කොට්ඨාශය අතර පුනර්භවයේදී ලිංගික වෙනස්කම් බහුල වශයෙන් සිදුව ඇති බව ත්, ලිංගික වෙනස්කම් සාමාන්‍ය සිද්ධියක් ලෙස සලකන රටවල පුනර්භාවී ලිංගික වෙනස්කම් සිදුව ඇත්තේ විරල වශයෙන් බවත් සනාථ වී ඇත. ඉන්දියාවේ භික්ෂූන් හා මියන්මාරයේ (බුරුමයේ) බෞද්ධයින් විසින් පුනර්භව ලිංග භේද වෙනස්කම් විශ්වාස කරන නමුත් එම රටවල පුනර්භාවී දරුවන්ගේ ලිංගික වෙනස්කම් ඉතා විරල වන අතර එම සිද්ධීන් මියන්මාරයට වඩා ඉන්දියාවේ පවතින ප්‍රතිශතය තව දුරටත් අවම බව ද අනාවරණය වේ.

**භෞතික සහ වෙනත් අනුරූපතාවන්**

විමර්ෂණයට භාජනය කරන ලද රුවන්ගෙන් 35% කට පමණ උපන් ලප සහ උපත් දෝෂ පවතින බව නිරීක්ෂණය කරන ලදී. මෙවැනි දරුවන්ගෙන් බහුතරයක් පුනර්භවයේදී තුවාල හෝ නිරෝගී තත්ත්වයන් හේතුවෙන් එම අනුරූපතාවන් මෙම ජීවිතයේදී ඇතිවිය හැකි බවත් පුනර්භවය දරුවන්ගේ වෛද්‍ය වාර්තා නිරීක්ෂණය කිරීම මගින් මෙම සාධක 40 කට වැඩි ප්‍රමාණයක් සනාථ වී ඇත. (Stevenson 1997 a, 1997 b) Pasricha (1998) වාර්ථා කරන අන්දමට පෙර භවයේදී තුවාල හා ශාරීරික ආබාධ, මෙම භවයේදි උපත ලැබූ පුනර්භාවී දරුවන්ගේ ශරීරය තුල උපන් ලප සහ වෙනත් සලකුණු ඇති ඉන්දියාවේ දරුවන් 10 දෙනෙකුගෙන් පමණ සනාථ වේ.

ඉන්දියාවේ මෙවැනි සිද්ධීන් ඇති බව වාර්ථා කරනුයේ Pasricha සහ Stevenson 1987 වන අතර තුර්කියේ එම තත්ත්වය වාර්තා කරනුයේ Keil සහ Stevenson 1998 විසිනි. විධිමත් විමර්ශන පැවැත්වීමට පෙර කාලවලදී ද මෑත කාලයේ දී සිදුකරන ලද විමර්ශන මගින් අනාවරණය වූ සාක්ෂි හෙළිදරව් වූ බව සනාථ වී ඇත (Fielding Hall 1898, Stevenson 1960, Sunderlal 1924).

ඉකුත් භවය පිළිබඳ මතකය තිබූ ඒකයුක්තානුක නිවුන් දරුවන් යුගල දෙකක ගේ ශාරීරික අංග හා චර්යාව එකිනෙකා අතර දැඩි ලෙස වෙනස්කම් දක්නට තිබුණි. ඔවුනට තම පෙර භවයේ ශාරීරික ලක්ෂණ හා චර්යා ලක්ෂණ පිළිබඳව මතකය තිබුණි ( Stevenson 1979 a, 1997 b, 1999) එම යුගල අතර එක සමාන ජානමය ලක්ෂණ තිබූ අතර පෙර ආත්මයේ පැවති වෙනස්කම් පිළිබඳව දැනුමක් ද ඇත. ඇතැම් සංස්කෘතීන්ට අනුව දෙමව්පියන් හෝ පවුලේ වෙනත් වැඩිමහල්ලන් විසින්, උපත ලැබූ දරුවන්ගේ සිරුරේ ඇති ලක්ෂණ අනුව එම දරුවා රෝගයකින් පෙළෙන්නෙක් දැයි නිගමනය කිරීමේ හැකියාව පවතී. ( Stevenson 1966, 1974b, 1987). දරුවකු පිළිබඳ සිහින දකින මව්වරුන් බොහෝමයකගේ අභිලාෂයන් ඉටුවීමට එවැනි පුනර්භාවී දරුවන් උපකාරී වේ. ඇතැම් දරුවන් තම මුල් අවදියේම පෙර භවය පිළිබඳ කතාකරන අතර ඇතැමුන් එසේ නොකරති. ඇතැමුන් තම පෙර භවයේ චර්යාවන්ගෙන් යුතුව කටයුතු කරන නමුත් කථාබහේ දී කිසිවක් හෙළි නොකරති. එවැන්නන් නිෂ්ශබ්දතාවය රකිමින් තම කටයුතු කරගෙන යති.

**විමර්ෂණාතාමක ක්‍රමවේද**

විමර්ශන පැවැත්විය යුතු වන්නේ ප්‍රත්‍යක්ෂ තොරතුරු ලබා දිය හැකි තොරතුරු සපයන්නන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගිනි. දරුවා විමර්ශකයා සමග සංවාදයේ යෙදීමට කැමැත්තක් දක්වන්නේ නම් එසේ කළ හැකි ය. එවැනි අවස්ථාවලදී විමර්ශකයා මෙන්ම භාෂා පරිවර්තකයෙකු වේ නම් ඔහු ද ඉතා සූක්ෂම අන්දමින් ප්‍රශ්න නැගීමේ ක්‍රමවේදය දක්ෂ අන්දමින් පාලනයකට භාජනය කරමින් කටයුතු කළ යුතු ය. දරුවා සමග සංවාදයේ යෙදීමෙන් පසු දෙමව්පියන්, සහෝදර සහෝදරියන් හා ආතා, ආච්චි ආදීන් ඉතා වැදගත් තොරතරු සපයන්නන් බවට පත් වේ. ඊට අමතරව පවුලේ වෙනත් සාමාජිකයින්ගෙන් හා අසල්වැසියන්ගෙන් ද වැදගත් තොරතුරු ලබාගත හැකි වේ. ඊලඟට වැදගත් තොරතුරු සපයන්නනන් බවට පත්වන්නේ පෙර භවයේ එනම් මියගිය තැනැත්තාගේ ඥාතින් ය.

පෙර භවයේ ජීවන තොරතුරු නිශ්චිතව පුනරුත්පත්තිගත දරුවාගෙන් ලබා ගැනීම ඇතැම් විට අපහසු වනු ඇත. එවැනි අවස්ථාවල විමර්ශන සාර්ථක නොවේ. එවැනි අසාර්ථක විමර්ශන ශ්‍රී ලංකාවේ හා ඇමරිකා එක්සත් ජනපදයේ බෙහෙවින් දක්නට ලැබේ (Cook සහ වෙනත් අය 1983).

ලිඛිත වාර්ථා ඇති අවස්ථාවලදී වාචික සාක්ෂි සම්බන්ධකර ගැනීමෙන් ද රෝහල් වාර්තා, මරණ පරීක්ෂක වාර්තා ආදිය ද උපකාරී කර ගනිමින් මෙම පරීක්ෂණය පැවැත්විය හැකි ය.

## අර්ථකථනය

පෙර භවයේ මතකය ඇති දරුවන් පිළිබඳ විමර්ශන පැවැත්වීම පහසු කාර්යයක් නොවේ. ඔවුන් අවබෝධ කරගැනීම එනම් ඔවුන්ගේ මතකය අර්ථකතනය කර ගැනීම පර්යේෂණය පැවැත්වීමට වඩා අපහසු කාර්යයකි.

## පුනරුත්පත්තිය

පුනරුත්පත්තිය පිළිබඳ සිද්ධි බහුලව ඇතිවීම, ඒ පිළිබඳ විවේචන අධික වීමට ද බෙහෙවින් හේතු වේ. බොහෝ විට පුනරුත්පත්ති ඇතිවන්නේ එකම පවුල තුල හෝ එකම ගම්මානය තුළ ය. ඇතමෙකු මියගිය අවස්ථාවන් හි **"ඔහු හෝ ඇය අප පවුලේම ඉපදේවා"** යන පැතුම බොහෝ අයගේ අපේක්ෂාව වන අතර ඊලඟට එම පවුලට උපදින දරුවාට පුනර්භාවී දරුවකු බවට පත්කිරීමට දෙමව්පියන් ද විවිධාකාර මායාකාරී උත්සාහයන් දරන අතර ආරෝපණයන් ද සිදුකරති. ඒ සඳහා දරුවා හුරුකර ගැනීම සඳහා අදාල වන ප්‍රශ්න ආදිය ඉදිරිපත් කිරිම ද ඒ සඳහා අවශ්‍ය පිළිතුරු තමන් විසින්ම සපයා දීම ද සිදු කරති. එවැනි සිද්ධීන් ගණනාවක් වාර්තා වී ඇත. Stevenson විසින් (1975) එවැනි නිදර්ශන 10 ක් ද නැවතත් Steveson හා සමරරත්න (1988 a, 1988 b) විසින් නිදර්ශන 3 ක් ද නැවතත් Steveson විසින් (1997 a) තවත් නිදර්ශන 15 ක් ද ඉදිරිපත් කරන ලදී. තව ද Mills විසින් එවැනිම නිදර්ශන 4 ක් ද (Mills 1989, Mills at al 1994), Pasricha (1990) විසින් නිදර්ශන 2 ක් ද Haraldsson විසින් නිදර්ශන 3 ක් ද ඉදිරිපත් කරනු ලැබ ඇත (Haraldsson 1991, Mills at al 1994).

**<u>සදොස් ස්මෘතිය හෙවත් දෝෂ සහගත මතකය</u>**

මෙම විමර්ෂනයත් හිදී අනාවරණය වූ විවේචනයට භාජනය වන තවත් කරුණක් වන්නේ මෙම සිද්ධියට අදාල පවුල් දෙක කලින් දන හඳුනා නොසිටි නමුත් හඳුනාගැනීමෙන් පසු වරින් වර ඇති වන සාකච්ඡාවන් නිසි අදාල මතකයන් දෙපාර්ශවය මගින් ම පටලවා ගනිමින් ව්‍යාකූල තත්ත්වයකට පත්කිරීමයි. එහි අහිතකර ප්‍රතිඵලය වන්නේ දෙපාර්ශවය විසින් ම අදාල දරුවා අතීන්ද්‍රීය දරුවකු බවට පත් කර විමර්ශනය ද අඩපණ කිරීමයි.

මෙම පවුල් දෙක මුණගැසෙන්නට පෙර සිදුවීම් පිළිබඳව ලිඛිත සාක්ෂි ලබා දී ඇත්තේ විමර්ශනයන්ගෙන් 1.5% කදී පමණි. මෙවැනි විමර්ශනයකදී මතකය පිළිබඳ ඇති වන වැරදි අතහැර දැමිය හැකි ය. මෙවැනි සිද්ධීන් අතරින් (Stevenson 1977) ගේ සිද්ධීන් දෙකක් ද Stevenson ගේ සහ Samararathna (1988 a, 1988 b) ගේ සිද්ධීන් 3 ක් ද Haraldsson (1991) ගේ සිද්ධීන් 2 ක් ද Mills හා වෙනත් අයගේ (1994) එක් සිද්ධියක් ද නිදර්ශන වශයෙන් මවිසින් ප්‍රකාශයට පත් කර ලදී.

දෙපාර්ශවය හමුවීමට පෙර දරුවාගේ ප්‍රකාශ සටහන් කරගත යුතු ය. දෙපාර්ශවය ඇතැම් විට දරුවාට කිව යුතු දේ උගන්වා ඉදිරිපත් කළ හැකි ය. එවැනි අවස්ථාවන් හි දී විමර්ශනය නිසි අයුරින් සිදු කළ නොහැකි ය.

## <u>අතීන්ද්‍රීය ප්‍රත්‍යක්ෂය (Extra Sensory, Perception)</u>

මින් අදහස් කරනුයේ පසිඳුරන්ගෙන් බැහැරව ලබන දැනුමයි. පුනරුත්පත්තිය පිළිබඳ තොරතුරු සපයන්නන් විසින් ලබා දෙන තොරතුරු සම්බන්ධයෙන් ඇගයීම සූක්ෂමව සිදුකළ යුතු ය. දරුවන් තුළ පවතින අතීන්ද්‍රීය දැනුම, වෙනත් පුද්ගලයින් ප්‍රශ්න කරන ආකාරය හා ඔවුන් විසින් සපයනු ලබන අනවශ්‍ය හැඟීම් ආදිය මගින් වියැකී යාමට අවකාශය ඇති බැව් පිළිගැනීමට සිදු වේ. එම පුද්ගලයින්, අනුමාන කරමින් අසන ප්‍රශ්න හා අදහස් මගින් මෙම දරුවන්ගේ මතක ශක්තිය හීන වී යා හැකිය. මියගිය තැනැත්තා ජීවත්ව සිටින විටදී පැවති චර්යාවන් භීතිය, ආකල්ප ආදිය දරුවාගේ අතීන්ද්‍රීය ප්‍රත්‍යක්ෂය හේතුවෙන් පවතින ලක්ෂණ විය හැකි නමුත් දරුවා ඇසුරු කරන්නන් විසින් මනසට ඇතුල් කරන ලද හැඟීම් ද විය හැකි ය.

(Stevenson 1992) පවසන අන්දමට මානව උපස්ථිතීන් ද තවත් ආකාරයක අර්ථකතනයන් විය හැකිය. මෙම සංකල්පයට අනුව ගර්භනී මාතාවන්ගේ මනසේ නූපන් දරුවාගේ ප්‍රතිබිම්බය පිළිබඳ හැඟීම් වර්ධනය විය හැකිය. ඇතැම් හැඟීම් අනුව දරුවාගේ උපන් ලප, රෝගාබාධ ආදිය ඇතිවිය හැකි නමුත් එම සළකුණු පිළිබඳ දරුවාට දැනුමක් හෝ මතකයක් තිබෙන්නට හැකියාවක් නැත. ඊට හේතුව උපදින දරුවා කිනම් පුනර්භවයකට සම්බන්ධ වන්නේදැයි මව නොදන්නා බැවිනි

(Stevenson 1977 a). එමෙන්ම බොහෝ දරුවන් විසින් ප්‍රදර්ශනය කරනු ලබන ලක්ෂණයන් වන භීතිය වැනි අසාමාන්‍ය චර්යාවන් ද පැහැදිලිව ප්‍රකාශ කල නොහැකි ය.

**<u>මෑතකදී ඇති වූ සංවර්ධන අවස්ථාවන්</u>**

ඉකුත් දස වසර තුලදී ස්වාධීන විමර්ශකයින් ගණනාවක් විසින් පවත්වන ලද විමර්ශනයන්ගෙන් අනාවරණය වූයේ 1960 දශකයේ සිට 1980 දශකය දක්වා පවත්වන ලද විමර්ශනයන්ගේ ප්‍රතිඵල හා සමාන ප්‍රතිඵලම ය. ඊට අමතරව ස්වාධීන විමර්ශකයින් දෙදෙනෙකු විසින් ඉතා වැදගත් පර්යේෂණ ක්‍රමවේද දෙකක් හඳුන්වා දෙන ලදී.

Haraldsson විසින් ශ්‍රී ලංකාවේ පෙර ආත්මය පිළිබඳ මතකය ඇති දරුවන් 30 දෙනෙකු පිළිබඳ මනෝවිද්‍යාත්මක පරීක්ෂණ පවත්වා එම වයසේම, එම ලිංගයේම හා එම පසුබිමේම දරුවන් 30 දෙනෙකු සමග සන්සන්දනය කරන ලදී (Haradsson 1995, 1997). මෙම පර්යේෂණයෙන් අනාවරණය වූයේ පුනර්භවේ දරුවන්ට අනිකුත් දරුවන් 30 දෙනාට වඩා බුද්ධිමත් බව ත්, වැඩි ස්මෘතියකින් යුතු බවත් ය.

ඉහත සඳහන් දරුවන් සම්බන්ධයෙන් Keil (1996) විසින් විශේෂ අධ්‍යයනයක් පවත්වන ලද්දේ දෙමව්පියන් විසින් මවන ලද සිහින අනුව අපේක්ෂිත උපන් ලප මෙන්ම අනිකුත් ලක්ෂණ ද මෙම දරුවන් තුළ තිබේ දැයි පරීක්ෂා කිරීමට ය. මෙම දරුවන් පිළිබඳ වසර ගණනාවක් මුළුල්ලේ ඔවුන්ගේ බිළිඳු වයසේ සිටම නිරන්තර පරීක්ෂාවෙන් යුතුව එම අධ්‍යයනය පවත්වන ලදී.

**<u>නිගමනය</u>**

වසර සියයක පමණ කාලයක් මුළුල්ලේ පුනර්භවය සිහිපත් කරන දරුවන් පිළිබඳ වාර්ථාවීම සාමාන්‍ය සංසිද්ධියක් බවට පත්ව තිබේ. බොහෝ සිද්ධීන් සම්බන්ධයෙන් වන සාක්ෂි බොහෝ දුරට නිර්වද්‍යතාවයෙන් තොර බවත් හෝ දුර්වලතාවයන්ගෙන් යුතු බවත් පෙනී යයි. බොහෝ සාක්ෂි ළාමක මනඃකල්පිතයන්ය. තවත් බොහෝ අවස්ථාවන්හී දී මියගිය තැනැත්තා ද එම පවුලේම හෝ පවුලට සම්බන්ධ සමීපතයෙකු වූ බවත් දරුවාටද එම තැනැත්තා පිළිබඳ පවුලේ සාමාජිකයන්ගෙන් දැනගැනීමට ලැබී ඇති බවත්, එම ආභාෂය දරුවාට ලැබී ඇති බවත් පෙනී යයි. මෙම සියළුම සැක සහිත හා පිළිගත නොහැකි අවස්ථාවන් අතහැර දැමීමෙන් පසු පිළිගත හැකි සිද්ධීන් සැලකිය යුතු ප්‍රමාණයක් පිළිබඳව ස්ථිර නිගමනයකට එළඹිය හැකිවිය. එම සිද්ධීන්ට අදාල දරුවන් මුළුමනින්ම මෙම පවුල් වලට හෝ ගමට හෝ පරිසරයට කිසිම සම්බන්ධතාවයක් නොමැති දුරස්ථ ප්‍රදේශයන් හි ජීවත් වූ පුද්ගලයින්ගේ ඍජු පෙර භව සම්බන්ධතායවයන් ය. එම සිද්ධීන් කිහිපයකගේ ලිඛිත වාර්තා ද පරීක්ෂා කරන ලදී. එම දරුවන් බොහෝමයකගේ ඇති උපන් ලප හා තුවාල සලකුණු පවා එම ස්ථානවලම ඒ අයුරින්ම මියගිය අයගේ චද ශරීරයේ තිබී ඇති බැව් සාක්ෂි මගින් සනාථ විය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Bering, Jesse. 2013. *Ian Stevenson’s Case for the Afterlife: Are We ‘Skeptics’ Really Just Cynics?* November 02. Accessed December 28, 2015. http://blogs.scientificamerican.com/bering-in-mind/ian-stevensone28099s-case-for-the-afterlife-are-we-e28098skepticse28099-really-just-cynics/.

Semkiw, Walter. n.d. *The Reincarnation Research of Ian Stevenson, MD of the University of Virginia Division of Perceptual Studies.* Accessed December 28, 2015. www.iisis.net/index.php%3Fpage%3Dsemkiw-ian-stevenson-reincarnation-past-lives-research.

Stevenson, Ian. 2005. "Reincarnation." In *Parapsychology*, by Jane Henry, 224-232. London and New York: Routledge Taylor and Francis Group.

Williams, Kevin. n.d. *Dr. Ian Stevenson's Reincarnation Research.* Accessed January 02, 2016. www.near-death.com/reincarnation/research/ian-stevenson.html.